

# 5

# නිවැරදි ශබ්දෝච්චාරණය

පැරණි අධ්‍යාපනයේ දී ප්‍රමුඛතාවක් හිමි වූයේ ශ්‍රවණයට ය. පොත පත බහුල නොවූ සමාජයේ කියවූ දේ ශ්‍රවණය කිරීමෙන් බොහෝ දෙනා දැනුම ලැබූහ. ඔවුහු 'බහුශ්‍රැතයෝ' වූහ.

අද පාසල් අධ්‍යාපනය තුළ කියවීම හා ලිවීම මූලික වෙයි. කියවීම ප්‍රගුණ කිරීමෙන් දැනුම වර්ධනය කර ගැනීමේ ඉඩ කඩ විවර වේ. එය දැනුම මූලික වූ ලෝකය තුළ තමාට හිමි තැන අත් පත් කර ගැනීමට ද ප්‍රබල රුකුලක් වෙයි.

චිරන්තන සාහිත්‍ය ග්‍රන්ථ රචනා කොට ඇත්තේ අසා රස විඳීම අරමුණු කර ගත් බණ කථා රීතියෙනි. ඒවා කියවීමේ දී අර්ථ රසය මෙන් ම ශබ්ද රසය කෙරෙහි ද සැලකිලිමත් වීම අවශ්‍ය ය.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## සිලාසොබ්භකණ්ඩක චේතිය

වට්ටගාමණී අභය විසින් කරවන ලද සිලාසොබ්භකණ්ඩක චේතියට කනිට්ඨතිස්ස විසින් ථූපඝරයක් කරවී ය. ඔහු එහි විශාල පිරිවෙණක් ද කරවී ය. ගෝඨාභය (ක්‍රි. ව. 253-266) එය ප්‍රතිසංස්කරණය කරවී ය. වර්තමාන ලංකාරාම ස්තූපය මුල දී ථූපඝරයක් සහිතව පැවති බවට සාධක තිබේ. මෙය මහා විහාරයේ ථූපාරාම ථූපඝරයට බෙහෙවින් සමාන වූවකි. ලංකාරාම ථූපඝරය තුළ බුදුපිළිම තැන්පත් කර තිබුණ බවට සාධක තිබේ. ථූපාරාම ථූපඝරයේ ද බුදුපිළිම තැන්පත් කර තිබුණ බවට සාධක තිබේ.

## රත්නප්‍රාසාදය

අභයගිරි විහාරයේ ස්තූපයට බටහිරින් ඇති විශාල ගොඩනැගිල්ලේ අවශේෂ රත්නප්‍රාසාදය ලෙස හැඳිනගෙන තිබේ. අභයගිරි විහාරයේ භික්ෂූන්ට පොහොය කිරීම සඳහා උපෝසථාගාරයක් ලෙස තනා ඇති එය ක්‍රි. ව. 2 සියවසේ දී කනිට්ඨතිස්ස රජු විසින් කරවන ලද්දකි. 2 වැනි මහින්ද (ක්‍රි. ව. 777-779) එය ඉතා අලංකාර ලෙස නැවත කරවී ය. එවිට එය මහල් ගණනාවකින් යුත් දෙව් විමනක් වැනි විය. ඔහු එහි රන් බුදුපිළිමයක් ද තැන්පත් කරවී ය. 1 වැනි සේන දවස (ක්‍රි. ව. 833-853) ඒ පිළිමය හා වටිනා වස්තු පාණ්ඩ්‍යයන් විසින් පැහැරගෙන ගිය අතර, 2 වැනි සේන (ක්‍රි. ව. 853-887) ඒවා නැවත ලබාගෙන එහි තැන්පත් කෙළේ ය.

සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ **අපේ සංස්කෘතික උරුමය** නම් ප්‍රකාශනය ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ අභිමානය නිරූපණය වන පරිදි පාලි, සංස්කෘත වචන සහිත මිශ්‍ර සිංහල භාෂා ව්‍යවහාරයෙන් රචනා වී ඇත. ඉහත උද්ධෘත එයින් උපුටා ගෙන ඇත.

මුල් කාලීන ගුවන් විදුලි ප්‍රවෘත්ති නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ලේඛන ව්‍යවහාරයෙන් ඉදිරිපත් කිරීමේ සම්ප්‍රදායක් පැවතිණ. අද වන විට ද එම සම්ප්‍රදාය රකිමින් ප්‍රවෘත්ති ඉදිරිපත් කරන ගුවන් විදුලි නාලිකා කීපයක් වෙයි.

පහත දැක්වෙන්නේ 2017 පෙබරවාරි 5 වැනි දින දහවල් 12.45ට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් ප්‍රචාරය කෙරුණු ප්‍රවෘත්ති ප්‍රකාශයෙහි ඇතුළත් වූ සිරස්තල කීපයකි.

වේලාව දහවල් දොළහයි හතළිස් පහ යි.

මේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව යි.

මෙන්න ප්‍රවෘත්ති, සංස්කරණය - ඉනෝකා බ්‍රෝහියර්, ප්‍රකාශය - ඥානින්ද පෙරේරා

- හෘදයාබාධයක දී ජීවිතය බේරා ගත හැකි ඖෂධයක් ආනයනය කිරීමට රජයේ අවධානය යොමු වේ.
- රට සංවර්ධනය කිරීම සඳහා දේශපාලනඥයන් හා පරිපාලන සේවකයන් එකට එක් ව කටයුතු කළ යුතු බව ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය පවසයි.
- 2016, 2017 විශ්වවිද්‍යාල අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් භාර ගැනීම 20 වැනි දායින් අවසන් වේ.
- විභාග දෙපාර්තමේන්තුවේ සියලු කාර්යයන් ඩිජිටල්කරණය කෙරේ.
- කළුතර සිට පයාගල දක්වා දුම්රිය මාර්ගය ද්විත්ව මාර්ගයක් ලෙස ඉදිකිරීම් ඇරඹේ.

ප්‍රවෘත්ති ඇතුළු ලේඛන කියවීමේ දී එහි අර්ථය අවබෝධ කර ගනිමින්, විරාම ලක්ෂණවලට අනුගත වෙමින් කියවීම ශ්‍රාවකයාට එහි අන්තර්ගතය මනාව ග්‍රහණය කර ගැනීම පිණිස හේතු වේ.

පැරණි සිංහල අධ්‍යාපන ක්‍රමයේ දී ශබ්ද නිවැරදිව උච්චාරණයට ශිෂ්‍යයා පුහුණු කරවීම කෙරෙහි වැඩි අවධානයක් යොමු විය. ඒ සඳහා ම විශේෂ වූ පැරණි පොත් ගණනාවක් විය. ශබ්දෝච්චාරණය ප්‍රගුණ කරවූයේ එම කෘතිවල ඇතුළත් කවි, ගාථා හා ශ්ලෝක ආශ්‍රයෙනි. **සකස්කඩ** හා **හිතෝපදේශය** යන පොත්වලින් උපුටා ගත් පාඨ සහ ශ්ලෝක ඔබ මීට ඉහත ශ්‍රේණිවල දී ඉගෙන ගෙන තිබේ. පහත දැක්වෙන්නේ **ප්‍රත්‍යය ශතකය** නම් ග්‍රන්ථයෙහි ඇතුළත් ශ්ලෝකයකි. එම ශ්ලෝකය නිවැරදිව උච්චාරණය කිරීමට පුහුණු වන්න. සංස්කෘත භාෂාවෙන් ලියැවී ඇති ශ්ලෝක උච්චාරණය කිරීම මඳක් දුෂ්කර ලෙස හැඟුණ ද නැවත නැවත අභ්‍යාසයෙහි නිරත වීමෙන් උච්චාරණය පහසු කරවනු ඇත.

හංසො විභාති සරසීරුහ වාරි මධ්‍යෙ
සිංහො විභාති ගිරිකුංජර නිර්ඣජරෙ ච
ජාත්‍යො විභාති තුරගො රණ වීර මධ්‍යෙ
විද්වාන් විභාති පුරුෂෙෂු විචක්‍ෂණෙෂු

(**ප්‍රත්‍යය ශතකය** 100)

හංසයා බබළන්නේ ජලාශයන්හි දී ය.
සිංහයාගේ වික්‍රමාන්විත බව ඇතුන් මැද ය.
සෛන්ධව අශ්වයාගේ බලය යුද්ධ භූමියේ දී ය.
විද්‍යාවන්ත පණ්ඩිතයාගේ බැබළීම එබඳු ම පණ්ඩිතයන් මැද ය.

සංස්කෘත හා පාලි භාෂාවන්හි මහාප්‍රාණ අක්ෂර සුලභ ය. එම අක්ෂර මැනවින් උච්චාරණය කළ යුතු ය. පාලි ගාථා උච්චාරණය පහසු වන අතර ඒවා ද කවි හා ශ්ලෝක මෙන් ම

තාලානුරූපව ගායනා කළ හැකි ය. පහත දී ඇති පාලි ගාථාව ද ඔබ දන්නා මෙවැනි වෙනත් ගාථා ද ගායනීය විලාසයෙන් උච්චාරණය කරන්න.

න භජෙ පාපකෙ මිත්තෙ
න භජෙ පුරිසාධමෙ
භජෙථ මිත්තෙ කල්‍යාණෙ
භජෙථ පුරිසුත්තමෙ

පාප මිත්‍රයන් හා අසත්පුරුෂයන් ඇසුරු නොකළ යුතු ය. කල්‍යාණ මිත්‍රයන් හා සත්පුරුෂයන් ම ඇසුරු කළ යුතු ය.

(ධම්මපදය - පණ්ඩිත වග්ග)

## ලිඛිත අභ්‍යාස

1. සවන් දෙන්නාගේ අවධානය දිනා ගැනීම සඳහා ප්‍රවෘත්ති කියවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ලියන්න.
2. පාඩමෙහි අන්තර්ගත ශ්ලෝකයෙන් හා ගාථාවෙන් ලබා දෙන උපදේශ ලියන්න.

## ප්‍රායෝගික අභ්‍යාස

1. පාඩමේ ඇතුළත් විවිධ ලේඛන, ඊට හිමි ශෛලියෙන් හඬ නගා උච්චාරණය වන සේ පන්තියේ දී ඉදිරිපත් කරන්න.
2. පාසල් පාදක ඇගයීම් ක්‍රියාවලියේ දී හා සිංහල භාෂා තරගවල දී කියවීමේ කුසලතා දැක්වීම සඳහා පාඩමේ ඇතුළත් ලේඛන මැනවින් පරිශීලනය කරන්න.
3. ගුරු උපදෙස් ඇතිව මඟුල් ලකුණ, ගණදෙවි හැල්ල, වදන් කවිපොත වැනි පොතක් සපයා ගෙන පන්තියේ කණ්ඩායම් අතර කියවීමේ තරගයක් පවත්වන්න.



# විරාම ලක්ෂණ

කථනයේ දීත් ලේඛනයේ දීත් විරාමය හෙවත් නැවතීම යෙදේ. කථනයේ දී යෙදෙන විරාමය හෙවත් නැවතීම ලේඛනයේ දී නිරූපණය කෙරෙන්නේ විරාම ලක්ෂණ මගිනි. විරාම ලක්ෂණ භාවිතය අදහස් පැහැදිලිව හා නිරවුල්ව ඉදිරිපත් කිරීමට උපකාරි වෙයි.

මීට ඉහත ශ්‍රේණිවල දී ඔබ පහත සඳහන් විරාම ලක්ෂණ පිළිබඳ දැනුවත් වී ඇත.

| විරාම ලක්ෂණය | නිදසුන |
|---|---|
| තිත (.) | අහස කළු විය.<br>වැස්සක් ඇද හැලිණි. |
| කොමාව (,) | නිල්, රතු, කහ මූලික වර්ණ වේ. |
| දෙතිත (:) | සංගීතඥයා: සංගීතය කියන්නේ විශ්ව භාෂාවක්.<br>1:50000 සිතියමක් ඇසුරෙන් පිළිතුරු සපයන්න. |
| විස්මයාදි ලකුණ (!) | අහෝ! දෙව්දත් නොදුටි මොක්පුර. |
| කෙටි ඉර (-) | අක්ෂර වින්‍යාසයේ දී ණ-න,<br>ල-ළ භේදය ඉගැන්වේ.<br>අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2017-10-05 ය. |
| ඇල ඉර (/) | මේ පෙති/කරල් උදේ/සවස බොන්න. |
| තනි උඩු කොමාව (’) | පෙර’ඹර හිරු නැඟෙයි. |
| තනි උඩු කොමා (‘’) | අක්ෂර, ‘වර්ණ’ යනුවෙන් ද හැඳින්වේ. |
| යුගල උඩු කොමා (“ ”) | “මෙහි එව” රජ නියෝග කළේ ය. |
| වරහන ( ) | හ්‍රස්ව (කෙටි) ස්වර අටකි. |

## ලිඛිත අභ්‍යාස

මීට පෙර ශ්‍රේණිවල දී ඔබ උගත් විරාම ලක්ෂණ ආශ්‍රයෙන් පහත සඳහන් අභ්‍යාසවල නිරත වන්න.

1. **පහත සඳහන් වාක්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.**

   i. ඒ වී සුරවීර මහතා සභාව අමතා හරවත් දේශනයක් පැවැත්වූයේ ය

   ii. ස තො ස ට ගොස් පැමිණි කාන්තාව අම්මෝ බඩුවල ගණන් යැයි මිතුරියට කීවා ය

   iii. දරුව ඔබට යහපතක් ම වේවා

   iv. සිංහල ගැමි ජීවිතය විදහා දැක්වෙන නවකතාවකි කේ ජයතිලකයන්ගේ චරිත තුනක්

   v. එස් මහින්ද හිමියන්ගේ දේශාභිමානී කවි මෙන් ම ළමා ගී ද රසවත් පද්‍ය නිර්මාණ ලෙස අගය කළ හැකි යැ යි දේශනයේ දී පැවසිණි

   vi. පෙ ව 10.30 11.00 දක්වා විවේක කාලය යි

   vii. කුරක්කන්වලින් විවිධ ආහාර වර්ග සාදනු ලැබේ
   
   නිදසුන් හැලප තලප පිට්ටු රොටී

   viii. චාරිකාව යන සෑම ශිෂ්‍යයකු ම අවශ්‍ය ආහාර පාර්සල් දෙක උදේ දවල් ගෙන ආ යුතු යැයි ගුරුතුමා දැන්වීම් පත්‍රිකාවේ සඳහන් කර තිබිණි

   ix. අනේ එව්පත සිදුවුණි

   x. තෙරේසා මවුතුමිය මුඩුක්කුවල සාන්තුවරිය 1910 1997 ලෙස හැඳින්වුණේ ඇය අසරණයන් උදෙසා සිදු කළ මෙහෙය නිසා ය




# අක්ෂර වින්‍යාස රීති

නංගී කැටය බිඳ මුදල් එළියට **ගනිමින්** එහි තිබූ කාසි **ගණිමින්** සිටියා ය.

වැසි සමය පැමිණි **කල** ගීත **කළ** බීම මිල දී ගැනීම අඩු වෙයි.

මේ වාක්‍ය දෙකෙහි තද කළු අකුරෙන් මුද්‍රිත වචන දෙස බලන්න. න, ණ, ල, ළ අකුරු යෙදීම නිසා එම වචන යුගලයන්හි අර්ථ වෙනස් වී ඇත.

ගනිමින් - යමක් අර ගනිමින්
ගණිමින් - ගණන් කරමින්
කල - කාලය
කළ - කරන ලද

මෙසේ වචනවල නිසි පරිදි අකුරු යෙදෙන පිළිවෙළ හැඳින්වෙන්නේ 'අක්ෂර වින්‍යාසය' නමිනි. භාෂාව නිරවුල්ව භාවිතයටත් අර්ථාවබෝධයටත් අක්ෂර වින්‍යාස රීති හඳුනා ගැනීම බෙහෙවින් ප්‍රයෝජනවත් වෙයි. එයින් ලේඛකයාගේ භාෂා කුසලතාව ද ඔප් නැංවෙයි.

සිංහල භාෂාව සකස් වී ඇත්තේ පාලි, සංස්කෘත යන මාතෘ භාෂා ඇසුරෙනි. එම භාෂාවලින් සිංහල භාෂාවට පැමිණි වචන බොහෝ ය. මීට අමතරව දෙමළ හා ඉංග්‍රීසි ආදි භාෂාවලින් පැමිණි වචන ද අද දක්වා ම භාවිතයේ පවතී. සිංහල භාෂාවේ ණ, න, ල, ළ, ශ, ෂ, ස ආදි අකුරු යෙදීමේ දී ඉහත කරුණ ගැන සැලකිලිමත් විය යුතු වෙයි.

6, 7, 8 ශ්‍රේණිවල දී ඔබ අක්ෂර වින්‍යාසයට අදාළ රීති ගණනාවක් උගෙන ඇත. ඒවා ද යළි මතකයට නංවා ගනිමින් අලුත් රීති කිහිපයක් හඳුනා ගනිමු.

# ණ, න අක්ෂර යෙදීම

**පාලි හා සංස්කෘත භාෂාවල යෙදෙන මූර්ධජ 'ණ' හා දන්තජ 'න' අකුරු සිංහලයෙහි ද ඒ ආකාරයෙන් ම යෙදේ.**

| | |
|---|---|
| ආවේණික | ලේඛන |
| ගුණධර්ම | පුනර්භව |
| වාණිජ්‍යය | ජනගහනය |
| නිරූපණය | කනිෂ්ඨ |
| ප්‍රවීණ | අනූන |
| අරුණාලෝකය | ඛනිජ |
| කෝණය | මර්දනය |
| නිර්වාණය | සංවර්ධනය |
| පරිණාමය | ත්‍යාග ප්‍රදානය |
| නිර්මාණ | ඝනාන්ධකාරය |
| පරිමාණය | මනඃකල්පිත |
| පරිගණකය | වර්තමාන |
| ජයග්‍රහණය | සම්භාවනීය |

**සමානරූපී වචනවල අර්ථයට අනුව මූර්ධජ 'ණ' හෝ දන්තජ 'න' යෙදේ.**

| | |
|---|---|
| නුවණ (ඥානය) | නුවන (ඇස) |
| දණ (දණ හිස) | දන (ජනයා) |
| වණය (තුවාලය) | වනය (කැලය) |
| කණ (ඇසක් නොපෙනෙන) | කන (අනුභව කරන/ශ්‍රවණේන්ද්‍රිය) |
| ගැණ (ගණින් කොට) | ගැන (පිළිබඳ) |
| කුලුණු (කරුණාව) | කුලුනු (කණු) |

**පාලි, සංස්කෘත භාෂාවලින් බිඳී එන වචනවල ද ඊට අනුරූපව මූර්ධජ 'ණ' හෝ දන්තජ 'න' යෙදේ.**

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාණ | - | පණ | අධිෂ්ඨාන | - | අදිටන |
| තෘණ | - | තණ | ප්‍රශ්න | - | පැන |
| ධරණී | - | දෙරණ | දුර්ජන | - | දුදන |
| කල්‍යාණී | - | කැලණි | නිදර්ශන | - | නිදසුන් |
| ආභරණ | - | අබරණ | ශාසන | - | සසුන් |
| දක්ෂිණ | - | දකුණ | කනිෂ්ඨ | - | කනිටු |
| උෂ්ණ | - | උණුසුම් | ලශුන | - | ලූනු |
| තීක්ෂ්ණ | - | තියුණු | ස්ථාන | - | තැන් |
| ලවණ | - | ලුණු | ආසන | - | අසුන් |
| සංලක්ෂණ | - | සලකුණු | ප්‍රසන්න | - | පහන් |
| තරුණ | - | තුරුණු | භෝජන | - | බොජුන් |

**ඇතැම් වචන, සිංහලයට අනුව සකස් වන විට මූර්ධජ 'ණ' අකුර දන්තජ 'න' බවට පත් වෙයි.**

| | | |
|---|---|---|
| කර්ණ | - | කන් |
| ස්වර්ණ | - | රන් |
| වර්ණනා | - | වැනුම් |
| ශ්‍රවණ | - | සවන් |
| කෝණ | - | කොන |
| නිර්වාණ | - | නිවන් |

# ල, ළ අක්ෂර යෙදීම

**මාතෘ භාෂාවල හා ඉංග්‍රීසියේ දන්තජ 'ල' ශබ්දය සහිත පද සිංහලයට බිඳ ගැනීමේ දී දන්තජ 'ල' වශයෙන් ම සිටී.**

| | |
|---|---|
| කලාව | සිංහල |
| විද්‍යාලය | කලල |
| කලාපය | කොලනිය |
| බාලිකාව | කොලරාව |
| මංගල | රැලිය |

**සමාන රූපී වචනවල අර්ථයට අනුව මූර්ධජ 'ළ' හෝ දන්තජ 'ල' යෙදේ.**

| | | | | | |
|---|---|---|---|---|---|
| ඇළ | - | දිය පාර | ඇල | - | පැත්ත |
| පැළ | - | පැළෑටි | පැල | - | කුඩා ගෙය |
| පිළි | - | රෙදි | පිලි | - | පිල්ලම් |
| මුළු | - | සියලු | මුලු | - | කොන් |
| අළු | - | ළිපේ අළු | අලු | - | ආලෝකය |
| තුළ | - | ඇතුළෙහි | තුල | - | සමාන |
| කුළ | - | කූටය | කුල | - | ගෝත්‍රය |
| දළ | - | දැඩි | දල | - | පත්‍ර |

**පාලි, සංස්කෘත වචනවල ඇති 'ට, ඨ, ඩ, ඪ' යන අකුරු සිංහල වචනවල දී මූර්ධජ 'ළ' බවට පත්වේ.**

| | | | | | |
|---|---|---|---|---|---|
| පටිමා | - | පිළිම | කුක්කුට | - | කකුළු |
| පටිපාටි | - | පිළිවෙළ | පඨවි | - | පොළොව |
| ඛේට | - | කෙළ | ක්‍රීඩා | - | කෙළි |
| නාටක | - | නළු | දෘඪ | - | දැඩි |

මාතෘ භාෂාවල 'ප්‍රති, පටි' උපසර්ග සිංහලයට බිඳීමේ දී 'පිළි' බවට පත් වෙයි.

| | |
|---|---|
| පිළිතුරු (ප්‍රතිඋත්තර/ප්‍රත්‍යුත්තර) | පිළිසරණ (පටිසරණ) |
| පිළිබඳ (ප්‍රතිබද්ධ) | පිළිසඳර (පටිසන්ථාර) |
| පිළිවෙත් (ප්‍රතිපත්ති) | පිළිවෙළ (පටිපාටි) |

## ශ, ෂ, ස අක්ෂර යෙදීම

මාතෘ භාෂා වචනවල ඇති 'ශ, ෂ, ස' අකුරු ඒ අයුරින් ම සිංහලයේ ද යෙදේ.

| | |
|---|---|
| විශ්වය | දෝෂ |
| ප්‍රශ්වාස | කොට්ඨාසය |
| ශූරතාව | ප්‍රසංගය |
| ආශ්වාස | විස්මය |
| විෂ | ආභාසය |

'ක, ප, ඵ, ට, ඨ' අකුරකට පෙර මූර්ධජ 'ෂ' අකුර යෙදේ.

| | |
|---|---|
| දුෂ්කර | නෛෂ්ඨික |
| විෂ්කම්භය | විශිෂ්ට |
| නිෂ්පාදනය | දෘෂ්ටිය |
| නිෂ්ඵල | පාපිෂ්ඨ |
| ශිෂ්ටාචාරය | ශ්‍රේෂ්ඨ |

'ච' අකුරට පෙර තාලුජ 'ශ' යෙදේ.

| | |
|---|---|
| නිශ්චල | ආශ්චර්ය |
| තිරශ්චීන | විනිශ්චය |
| නිශ්චිත | |

'ත, ථ' අකුරකට පෙර දන්තජ 'ස' යෙදේ.

| | |
|---|---|
| විස්තරය | ස්තූපය |
| ප්‍රස්තාව පිරුළු | ප්‍රස්තාර |
| ප්‍රශස්ති | ශාස්ත්‍ර |
| සමස්ත | ස්ථූල |
| ස්ථාවර | විහාරස්ථානය |
| ගෘහස්ථ | මධ්‍යස්ථ |
| දේවස්ථාන | මාර්ගස්ථ |

## ලිඛිත අභ්‍යාස

**1. ඔබ උගත් අක්ෂර වින්‍යාස රීති ආධාර කර ගනිමින් හිස්තැන් පුරවන්න.**

i. ලබන පුන් පොහෝ දිනයෙහි පූර්__ චන්ද්‍රග්‍රහ__යක් සිදු වේ යැයි වි__වාස කෙරේ.

ii. ක__ගුණ සැලකීම ශ්‍රේ__ඨ මා__ව ගු__ංගයකි.

iii. දැඩි උ__ණාධික දේ__ගු__ය දරා ගත නො හැකිව විවිධ රටවල ජනයා දු__කරතාවන්ට මුහුණ දෙති.

iv. ප්‍ර__න සියල්ලට ම සාර්ථකව පි__තුරු සැපයීමට සිසුන්ට හැකි විය.

v. අපේ පුරා__ රජවරු වර්__ ජලයෙන් වැව් පුරවා, ඇ__වේලි දිගේ කුඹුරුවලට ගෙන ගොස් වී ගොවිතැනින් රට __ශ්‍රීක ක__හ.

2. පහත දැක්වෙන දැන්වීම් පුවරුවල ඇති වැරදි වචන නිවැරදි කර ලියන්න.




3. පහත දී ඇති වචන අතුරින් අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන නිවැරදි කර ලියන්න.

| | |
|---|---|
| i. ආශීර්වාදය | ii. තාක්ෂණය |
| iii. ප්‍රමානය | iv. වීරෝධාර |
| v. සුළඟ | vi. සුවිශේෂ |
| vii. උත්කෘශ්ට | viii. විශ්වාස |
| ix. විශ්වකෝෂය | x. ශ්‍රවනාගාරය |
| xi. පෝසණය | xii. දර්ශණය |
| xiii. පැරනි | xiv. පුෂ්ඵය |
| xv. ණයකරු | xvi. අනුශාසනය |
| xvii. අභ්‍යවකාසය | xviii. දොලොස්වැනිදා |
| xix. වෙරළාසන්න | xx. ඖෂධ |

4. 'අපේ සංස්කෘතික උරුමය' නම් ප්‍රකාශනයෙන් උපුටාගත් කොටස්වල ඇති මහාප්‍රාණ අක්ෂර සහිත වචන උපුටා දක්වන්න.